# 2024-12-18 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ.(1) ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ.(1) පරිදි පැවරී ඇති බලතල අනුව සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්තිසහගත, විනිවිද පෙනෙනසුලු, තරගකාරී සහ පිරිවැය සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම එකී කොමිෂන් සභාවේ කර්තව්‍යය වේ. ඒ අනුව, සකස් කරනු ලැබ ඇති රජයේ ආයතන විසින් භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදනය කරනු ලැබීම සහ ඒ හා සම්බන්ධය ඊට අනුෂාංගික කරුණු පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024, අංක 2412/01 දරන 2024-11-25 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී මාර්ගෝපදේශ සංග්‍රහය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 02. රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය

අත්‍යවශ්‍ය මහජන සේවාවන් සැපයීම, ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය රැකීම, විවිධ නියාමන කටයුතු, භාණ්ඩ හා සේවා සැපයීමට අදාළව වෙළෙඳපොළ කටයුතුවලට මැදිහත්වීම, සම්පත් සාධාරණව බෙදාහැරීම, ආපදා කළමනාකරණය සහ සමාජ සුබසාධනය වැනි ප්‍රධාන කාර්යයන් රජය වෙත පැවරී ඇත. එම කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ආරක්ෂක අංශ සහ පොලිසිය හැරුණු විට දෙපාර්තමේන්තු 86ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 339ක්, රජයට අයත් ව්‍යාපාර 340ක් සහ වාණිජමය නොවන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන 115ක් මෙ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින වාණිජමය නොවන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන 115ක් සඳහා සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට ගැනෙන ආයතන 51ක් සඳහා 2024 වර්ෂය වෙනුවෙන් ජාතික



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியு, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තෙ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

අයවැය මඟින් රුපියල් බිලියන 140ක් පමණ වෙන් කර ඇත. වත්මන් අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් එම ආයතන යාවත්කාලීන නොවීම, පැවරී ඇති බලතල ප්‍රමාණවත් නොවීම හෝ නොගැළපීම, එම ආයතන වෙත පැවරී ඇති කාර්යයන් පෞද්ගලික අංශය විසින් වඩාත් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීම සහ එකම හෝ සමාන හෝ කාර්යයන් ඉටු කරනු ලබන ආයතන කිහිපයක් පැවතීම වැනි කරුණු හේතුවෙන් රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. ඒ අනුව, එවැනි සමාලෝචනයක් සිදු කර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරි කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

03. **ඩිජිටල් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද සාර්ථක ඩිජිටල් විසඳුම් හුවමාරු කිරීමේ සහයෝගිතාව පිළිබඳව ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම**

තොරතුරු තාක්ෂණයේ සහ ඩිජිටල් නවෝත්පාදනයේ ප්‍රමුඛයා වශයෙන් ඉන්දියාව ඉ-රාජ්‍ය පාලනය, මූල්‍ය තාක්ෂණ ක්‍රමවේද, කෘත්‍රිම බුද්ධිය සහ ඩිජිටල් යටිතල පහසුකම් වැනි ක්ෂේත්‍රවල අත්කරගෙන ඇති විශේෂඥ දැනුම බහුවිධ ක්‍රියාකාරකම් හරහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් සංවර්ධනය සඳහා ලබා ගැනීමට හැකියාව පවතී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සහ ඉන්දියාවේ ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට දෙපාර්ශ්වය අතර මූලික එකඟතාවකට පැමිණ තිබේ. එමඟින්, ඩිජිටල් සංවර්ධන ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ ධාරිතා වර්ධනය කිරීමට සහ ඩිජිටල් සංවර්ධන විසඳුම් ක්‍රියාත්මක කිරීමේදී දෙරට අතර ආයතනික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

04. **ශ්‍රී ලංකා පොලීසියේ වාහන අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ඉන්දීය රජය විසින් ලබා දෙනු ලබන මූල්‍ය ප්‍රදානය**

ශ්‍රී ලංකා පොලීසියේ වාහන අවශ්‍යතාව සපුරාලීම සඳහා සහාය ලබා දීමක් ලෙස ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 300ක මුදල් ප්‍රදානයක් ලබා දීමට එකඟතාව පළ කර ඇත. එම ප්‍රදානය භාවිත කරමින් උතුරු පළාතේ පොලිස් ස්ථානවල රාජකාරි අවශ්‍යතා සඳහා කැබ් රථ ලබා දීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, එකී ප්‍රදානය ලබා ගැනීම සඳහා දෙපාර්ශ්වය අතර අවබෝධතා ගිවිසුමට එළඹීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස උසස් ආරයේ ගවයන් ආනයනය කිරීම**

උසස් තත්ත්වයේ ජාන හැකියාවක් සහිත ගවයන් ලබා ගැනීම සඳහා 2023 හා 2024 වර්ෂ දෙකෙහිම රුපියල් මිලියන 100 බැගින් වෙන් කර තිබුණ ද, අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීම සම්බන්ධයෙන් පැන නැගී තිබූ ගැටලු හේතුවෙන් අවශ්‍ය ගවයන් සපයා ගැනීමට මෙතෙක් නොහැකි වී ඇත. එබැවින්, සෘජුවම රජයන් දෙකක් අතර සිදු කරනු ලබන ගනුදෙනුවක් වශයෙන් සුදුසු ගවයන් මිල දී ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් රටවල් කිහිපයකින් තොරතුරු විමසා ඇති අතර, පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයේ මැදිහත් වීම යටතේ පාකිස්තාන වෙළෙඳ සංවර්ධන අධිකාරිය විසින් සහිවාල් හා නිලිරවි වර්ගවලට අයත් ශුක්‍රදායක පුං ගවයන් හත්දෙනෙකු (07) මෙරටට සැපයීමට එකඟතාව පළ කර තිබේ. එසේම, පුං ගවයන් ආනයනය කර ගව ශුක්‍ර නිෂ්පාදනය කරන තෙක් සහිවාල් ගව ශුක්‍ර වඩි 20,000ක් ඉන්දියාවේ ජාතික කිරි සංවර්ධන මණ්ඩලයෙන් රජයකින් රජයකට ගනුදෙනුවක් ලෙස මිල දී ගැනීම යෝග්‍ය බවට තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රජය හා පාකිස්තාන රජය අතර ගනුදෙනුවක් ලෙස සහිවාල් වර්ගයට අයත් පුං ගවයින් පස්දෙනෙකු (05) හා නිලිරවි වර්ගයට අයත් පුං ගවයන් දෙදෙනෙකු (02) මිල දී ගැනීමටත්, සහිවාල් ගව ශුක්‍ර වඩි 20,000ක් ඉන්දියාවේ ජාතික කිරි සංවර්ධන මණ්ඩලයෙන් රජයන් අතර ගනුදෙනුවක් ලෙස මිල දී ගැනීමටත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට 2025 වර්ෂය සඳහා අමතර කොටස්, භාණ්ඩ හා ද්‍රව්‍ය මිල දී ගැනීම**

අමතර කොටස් හා උපාංග මිල දී ගැනීම, නව ටයර් කට්ටල සපයා ගැනීම, ප්‍රාදේශීක සඳහා ටයර් පෙරසවි සේවා සැපයීමේ ආයතන තෝරා ගැනීම, ග්‍රීස් සහ ලිහිසි තෙල් සපයා ගැනීම හා නව එන්ජින් කට්ටල සපයා ගැනීම ඇතුළුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා 2025 වර්ෂය වෙනුවෙන් අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කළ යුතුව ඇත. එකී ප්‍රසම්පාදනයන් අතුරින් ප්‍රසම්පාදනයන් හතරක් (04) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරි සීමාව ඉක්මවා යන බැවින්, එම ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කළ යුතුව ඇත. ඒ අනුව, එකී ප්‍රසම්පාදනයන් වෙන් වෙන් වශයෙන් අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව මඟින් ක්‍රියාත්මක කිරීමටත්, අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවට සහාය වීම පිණිස එම ප්‍රසම්පාදනයන් හතර (04) සඳහා වෙන් වෙන්ව තාක්ෂණික ඇගයීම් කමිටු 04ක් පත් කිරීමටත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම**

මුලතිව්, කිලිනොච්චි, බදුල්ල, මොනරාගල, රත්නපුර, කෑගල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක 07හි ග්‍රාම නිලධාරි වසම් 540ක් කේන්ද්‍ර කර ගනිමින් නල ජල සේවා සඳහා ප්‍රවේශය වැඩි කිරීමට සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට "ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" ආරම්භ කර ඇත. ඒ සඳහා ලෝක බැංකුවේ ආයෝජන ව්‍යාපෘති මූල්‍ය සාධන පත්‍රය යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් ඇමෙරිකානු ඩොලර් මිලියන 165ක ණය මුදලක් ලබා දී තිබේ. ව්‍යාපෘතියේ විෂය පථය තවදුරටත් පුළුල් කිරීම සඳහා ලෝක බැංකුව විසින් අතිරේක මූල්‍ය සංරචකයක් (දෙවන අදියර) අනුමත කරනු ලැබ ඇති අතර, ඒ යටතේ මාතර, කුරුණෑගල, මාතලේ සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල ද නල මාර්ග දිගු කිරීමේ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලැබ ඇත. 2025-06-30 වන විට ව්‍යාපෘති අවසන් කිරීමට සැලසුම් කර ඇති නමුත් ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම සහ එකතු කළ අගය මත බද්ද (VAT) සංශෝධනය කිරීම වැනි කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ

මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 1,180කින් වැඩි කළ යුතුව තිබේ. ඒ අනුව, ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය කිරීමටත්, අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කර ගැනීමටත් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරවේල ලබා දීමේ වැඩසටහන**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ජාතික ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික මඟපෙන්වීම යටතේ අඩු බර සහිත දරුවන් වැඩි ප්‍රතිශතයක් සිටින මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරවේල ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. දැනට එක් දරුවෙකු සඳහා දිනකට රුපියල් 60/-ක් ලබා දෙනු ලබන අතර, 2025 වර්ෂය තුළ දරුවන් 155,000කට පමණ ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කෙරේ. වර්තමානයේ ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම හේතුවෙන් එක් දරුවෙකු සඳහා දිනකට වෙන් කර ඇති රුපියල් 60/-ක මුදල ප්‍රමාණවත් නොවන බැවින්, එම මුදල රුපියල් 100/- දක්වා වැඩි කිරීමටත්, "අඩු බර සහිත දරුවන් වැඩි ප්‍රතිශතයක් සිටින පෙර පාසල්" යන නිර්ණායකය පදනම් කර ගෙන තෝරා ගනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල්වල එම වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීමටත් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **හිංසනයෙහි වින්දිතයින් බවට පත් වන කාන්තාවන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා වන තාවකාලික රැකවරණ නිවාස පරිපාලනය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හමුවේ හිංසනයෙහි වින්දිතයන් බවට පත්වන කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් තාවකාලික රැකවරණය සැලසීම සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ගම්පහ, රත්නපුර, මොනරාගල, කොළඹ, මාතර, මඩකලපුව, මුලතිව් හා යාපනය යන දිස්ත්‍රික්කවල එක් රැකවරණ නිවාසයක් බැගින් ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ රැකවරණ නිවාස 02ක් ද වශයෙන් රැකවරණ නිවාස 10ක් පවත්වා ගෙන යනු ලබන අතර, නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා රැකවරණ

නිවාසයක් 2025 ජනවාරි මාසයේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ඇතැම් රැකවරණ නිවාසවල පරිපාලන හා නඩත්තු වියදම් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් සෘජුවම දරනු ලබන අතර, ඇතැම් නිවාස සඳහා අදාළ වියදම් කාන්තා සුබසාධනය මූලික කරගත් සංවිධාන කිහිපයක් විසින් දරනු ලබයි.2020 වර්ෂයේ සිට 2024 වර්ෂයේ දෙවන කාර්තුව දක්වා වින්දිත කාන්තාවන් 2,852ක් වෙනුවෙන් රැකවරණය සලසා ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 60.35ක පිරිවැයක් දරා ඇත. එහෙත්, එම කාලය තුළ ඒ වෙනුවෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත රුපියල් මිලියන 37.69ක් පමණක් ප්‍රතිපාදන වශයෙන් ලැබී ඇති අතර, රුපියල් මිලියන 22ක පමණ බිල්පත් තවදුරටත් නිරවුල් කළ යුතුව තිබේ. ඒ අනුව, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සැලකිල්ලට ගෙන 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 25ක ප්‍රතිපාදන වෙන් කිරීමටත්, ඉන් අනතුරුව ඉදිරි වර්ෂයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර දීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

**10. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ කෘත්‍රිම ධාවන පථයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නැවත ඇතිරීම**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය යනු ජාත්‍යන්තරව පිළිගත් පළමු පන්තියේ ක්‍රීඩා පහසුකම් සපයන ක්‍රීඩා සංකීර්ණයක් වන අතර, සියලු පහසුකම් හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහිත මීටර් 400, 200 සහ 80 කෘත්‍රිම ධාවන පථවලින් සමන්විත ශ්‍රී ලංකාවේ ඇති එකම ක්‍රීඩා සංකීර්ණය වේ. 2018 වර්ෂයේදී මෙම කෘත්‍රිම ධාවන පථයන් නැවත එලීම සිදු කර ඇති අතර, මේ වනවිට එහි පළුදුවීම් රාශියක් පවතින හෙයින්, ජාතික තලයේ ක්‍රීඩා තරගවලට පවා නුසුදුසු තත්ත්වයක පවතින බවට ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය විසින් වාර්තා කර තිබේ. ජාතික හා ජාත්‍යන්තර තලය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කිරීම පිණිස අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් මෙම කෘත්‍රිම ධාවන පථ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංස්කරණය කිරීම ජාතික වශයෙන් ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු කාර්යයක් බව හඳුනාගෙන ඇත. ඒ අනුව, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම, ඒ මැද පිහිටි පාපන්දු පිටිය සැකසීම, ඒ සඳහා අවශ්‍ය විද්‍යුත් කාලගණන යන්ත්‍ර සවි කිරීම සහ ආලෝක කුලුනු ප්‍රතිසංස්කරණය කිරීම යන කාර්යයන් නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සිදු කිරීම පිණිස තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ නව නියමයක් නිකුත් කිරීම**

රට තුළ විදේශ විනිමය සංචිත ආරක්ෂා කිරීම සඳහා ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ තාවකාලිකව අත්හිටුවීම සහ සීමා කිරීම් පැනවීම මඟින් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ මත 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ 2020-04-02 දින සිට වරින්වර නියමයන් නිකුත් කරනු ලැබ ඇත. රට තුළ විදේශ විනිමය වෙළෙඳපොළේ ඇති වූ වැඩිදියුණුවීම් සහ අනාගත අපේක්ෂා සැලකිල්ලට ගෙන, ඇතැම් අත්හිටුවීම්/සීමා කිරීම් ක්‍රමිකව ඉවත් කිරීමේ/ලිහිල් කිරීමේ අරමුණින් 2023 ජූනි මාසයේ සිට මේ දක්වා නියමයන් 10ක් නිකුත් කරනු ලැබ ඇති අතර, දැනට බලාත්මක නියමයේ වලංගු කාලය 2024-12-19 දිනෙන් අවසන් වීමට නියමිතව තිබේ. දැනට ක්‍රියාත්මක වන නියමය යටතේ පනවා ඇති ඇතැම් අත්හිටුවීම් සහ සීමාකිරීම් තවදුරටත් සංශෝධනය කරමින් 2025 ජූනි මාසය දක්වා බලපැවැත්වෙන පරිදි නව නියමයක් නිකුත් කිරීම යෝග්‍ය බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කර ඇත. ඒ අනුව, 2024-12-20 දින සිට බලාත්මක වන පරිදි මාස හයක (06) කාලසීමාවක් සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ නියමයක් නිකුත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පළ කරන ලද නියමයක් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

ක්ලින්කර්, සිමෙන්ති තොග සහ සිමෙන්තිවල සිල්ලර වෙළෙඳ ඇසුරුම් වශයෙන් ඇති බෑග් ආනයනය කිරීමේදී කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 1/- බැගින් සෙස් බද්ද අඩු කිරීමටත්, ඉදිකිරීම් කාර්යයන් සඳහා පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව මෙට්‍රික්ටොන් මිලියන 1ක් දක්වා ප්‍රමාණයක් කලුගල් කුට්ටි අපනයනය කිරීමට සහ කියුබික් මීටර 1ක් සඳහා රුපියල් 1,000/-ක අනු ප්‍රමාණයකින් යුත් සෙස් බද්දක් නියම කර අය කර ගැනීමටත්, එවකට මුදල් විෂය භාර ඇමතිතුමාගේ එකඟත්වය ඇතිව, එවකට ආයෝජන ප්‍රවර්ධන ඇමතිතුමා විසින් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14වන වගන්තිය යටතේ නියමයක් අංක 2400/25 හා 2024-09-05 දිනැති අති

විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇත. ඒ අනුව, එකී නියමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. භාර ආඥාපනත සංශෝධනය කිරීම

2025 වසරේදී සිදු කිරීමට නියමිත ශ්‍රී ලංකාව පිළිබඳ අන්‍යෝන්‍ය ඇගයීමේදී, යහපත් ස්ථානයක් ලබා ගැනීම උදෙසා භාර ආඥාපනතේ විධිවිධාන සංශෝධනය කිරීමේ අවශ්‍යතාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිණිස වන ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා කටයුතු කරන අන්තර් රාජ්‍ය සංවිධානයක් වන මූල්‍ය කාර්යසාධක බලකාය විසින් පෙන්වා දී ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් යෝජිත සංශෝධන ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, එකී යෝජිත සංශෝධන ඇතුළත් කරමින් භාර ආඥාපනත සංශෝධනය කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. ලුණු හිඟය පියවා ගැනීමට ලුණු ආනයනය කිරීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය රටේ ගෘහ හා කාර්මික අවශ්‍යතා සඳහා පවතින ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන අතර, ලුණු අස්වැන්න කාලගුණික තත්ත්වයන් මත රඳා පවතී. රට තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් 2025 වසරේ පළමු කාර්තුවේදී දේශීය වෙළෙඳපොළේ ගෘහ සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා වන ලුණු සැපයීමේ හිඟයක් ඇති විය හැකි බවට නිරීක්ෂණය වී තිබේ. ඒ සඳහා පිළියමක් ලෙස සකස් කර වෙළෙඳපොළට සැපයීම පිණිස පවතින තීරු බදු අනුපාතය අනුව අමු අයඩීකරණය නොකළ ලුණු මෙට්‍රික්ටොන් 30,000ක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ලුණු නිෂ්පාදකයින් විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අමු අයඩීකරණය නොකළ ලුණු මෙට්‍රික්ටොන් 30,000ක උපරිමයකට යටත්ව, 2025-01-31 දින හෝ ඊට පෙර සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් ආනයනය කර දේශීය ලුණු නිෂ්පාදකයින් මඟින් වෙළෙඳපොළට සැපයීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 15. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම

කනි සංයුක්ත බද්දක් වශයෙන් ක්‍රියාත්මක වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ වර්ග 63ක් ආනයනය කිරීම සඳහා විධිවිධාන සලසා ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත පරිච්ඡින්න කළ යුතු බවට 2024-03-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ තිබේ. එහෙත්, එකී පනත පරිච්ඡින්න කිරීමත් සමඟ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අදාළ වන භාණ්ඩ ආනයනය කිරීමේදී එකතු කළ අගය මත බද්ද ඇතුළුව අනෙකුත් බදු අදාළ වීම හේතුවෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වෙළෙඳපොළ මිල කෙරෙහි සිදුවිය හැකි බලපෑම සහ දේශීය ගොවීන් සඳහා පහසුකම් සැලසීමේ රජයේ ප්‍රතිපත්තියට ඇති විය හැකි අහිතකර බලපෑම සැලකිල්ලට ගෙන, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත තවදුරටත් ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බවට පෙනී ගොස් ඇත. එබැවින්, එකී බද්ද පරිච්ඡින්න කිරීම සඳහා වන 2024-03-25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොකිරීමටත්, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතට යටත් වන භාණ්ඩ සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනු ප්‍රමාණ 2025-01-01 දින සිට බලාත්මකව පවත්වාගෙන යාම පිණිසත් අවශ්‍ය පියවර ගැනීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************